**උපලේඛනය**

**මහා කප්පින සීමා මාලක විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 19, වැල්ලබඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වැලිවතුගොඩ ග්‍රාමයේ පිහිටි, ඉඩමට සර්වේයර් ජනරාල්ගේ 2024 අප්‍රේල් මස 04 දින හා අංක GA/BLP/2022/565 දරන අනුරේඛනයට අනුව කැබලි අක්ෂර ‘ඒ’ සහ ‘බී’ වශයෙන් නිරූපිත කප්පිනවලව්ව වත්ත නමැති ඉඩම සමන්විත හෙක්. 0.8422 (අ.2, රූ.0, පර්.13) ක් විශාලත්වයෙන් යුක්ත පහත මායිම් වූ බිම් ප්‍රදේශය:

**කැබලි අක්ෂර ‘ඒ’ – කප්පිනවලව්ව වත්ත – හෙක්. 0.8417 (අ. 2, රූ. 0, පර්. 12.8)**

*උතුරට* : මාර්ගය (ප්‍රාදේශීය සභාව);

*නැගෙනහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභාව), ගාල්ල මූලික පිඹුර 3522 හි කැබලි අංක 1, 14, 15, 25, 26, 37 සහ 38;

*දකුණට* : ගාල්ල මූලික පිඹුර 3522 හි කැබලි අංක 1, 14, 15, 25, 26, 37 සහ 38, ගාල්ල මූලික පිඹුර 3522 හි කැබලි අක්ෂර බී, කැබලි අංක 2, 44, 50 සහ පී. දිලිප් ප්‍රියන්ත ද සිල්වා සහ තවත් අය භුක්ති විඳින කප්පිනවලව්ව වත්ත;

*බටහිරට* : ගාල්ල මූලික පිඹුර 3522 හි කැබලි අංක 2, පී. දිලිප් ප්‍රියන්ත ද සිල්වා සහ තවත් අයද, එච්. එස්. එම්. ද සිල්වා, ආර්. අරුණ ශාන්ත, හෂාන් ද සිල්වා, පී. සුමිත් සඳලාල්, එස්. සෝමලතා, ඩී. ඒ. කේ. සුදත් රෝහණ යන අය භුක්ති විඳින කප්පිනවලව්ව වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

**කැබලි අක්ෂර ‘බී’ – කප්පිනවලව්ව වත්ත – හෙක්. 0.0005 (අ. 0, රූ. 0, පර්. 0.2)**

*උතුරට* : කැබලි අක්ෂර A;

*නැගෙනහිරට* : ගාල්ල මූලික පිඹුර 3522 හි කැබලි අංක 38 සහ 2;

*දකුණට* : ගාල්ල මූලික පිඹුර 3522 හි කැබලි අංක 2 සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව);

*බටහිරට* : ගාල්ල මූලික පිඹුර 3522 හි කැබලි අංක 2 සහ සර්වේයර් ජනරාල්ගේ අංක GA/BCP/2022/565 දරන අනුරේඛනයේ කැබලි අක්ෂර A.

EOG 06 – 0197

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.